*සැ. යු.*- මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2021 වර්ෂය සඳහා ගාල්ල - බලපිටිය දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,217 - 2021 පෙබරවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2021.02.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 416 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 421 |

*සැ. යු.* - (i) වර්ල්ඩ් ලයිෆ් ලයින් යෝගා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 පෙබරවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 පෙබරවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 මාර්තු මස 19 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 මාර්තු මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

413 B 82208 — 5,403 (2021/02)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පුරප්පාඩු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *තනතුරු නාමය* - කළමනාකරු (ප්‍රවාහන සහ නඩත්තු)
*සේවා ශ්‍රේණිය* - ''කණිෂ්ඨ කළමනාකාර''
*පුරප්පාඩු ගණන* - 01

01.1 සුදුසුකම් :

01.1.1. බාහිර අයදුම්කරුවන් —

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, කළමනාකරණය හෝ වාණිජවේදී යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

02. *තනතුරු නාමය* - විද්‍යාත්මක නිලධාරි
*සේවා ශ්‍රේණිය* - ''කණිෂ්ඨ කළමනාකාර''
*පුරප්පාඩු ගණන* - 06

02.1 සුදුසුකම් :

02.1.1. බාහිර අයදුම්කරුවන් —

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම;

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

03. *තනතුරු නාමය* - උපදේශන නිලධාරි
*සේවා ශ්‍රේණිය* - ''කණිෂ්ඨ කළමනාකාර''
*පුරප්පාඩු ගණන* - 02

03.1 සුදුසුකම් :

03.1.1. බාහිර අයදුම්කරුවන් —
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/මනෝ විද්‍යාව/අපරාධ විද්‍යාව/සමාජ වැඩ පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

04. *තනතුරු නාමය* - ප්‍රතිකාර හා විමර්ශන නිලධාරි
*සේවා ශ්‍රේණිය* - ''කණිෂ්ඨ කළමනාකාර''
*පුරප්පාඩු ගණන* - 01

04.1 සුදුසුකම් :

04.1.1. බාහිර අයදුම්කරුවන් —

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, විශ්වවිද්‍යාලයකින් සමාජ විද්‍යාව/මනෝ විද්‍යාව/අපරාධ විද්‍යාව/සමාජ වැඩ යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

05. *තනතුරු නාමය* - මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරි
*සේවා ශ්‍රේණිය* - ''කණිෂ්ඨ කළමනාකාර''
*පුරප්පාඩු ගණන* - 03

05.1 සුදුසුකම් :

05.1.1. බාහිර අයදුම්කරුවන් :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජීය විද්‍යාවන් යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

06. *තනතුරු නාමය* - බාහිර සේවා නිලධාරි
*සේවා ශ්‍රේණිය* - ''කණිෂ්ඨ කළමනාකාර''
*පුරප්පාඩු ගණන* - 03

06.1. සුදුසුකම් :

06.1.1. බාහිර අයදුම්කරුවන් —

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/මනෝ විද්‍යාව/අපරාධ විද්‍යාව/සමාජ වැඩ යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

07. *තනතුරු නාමය* - පර්යේෂණ නිලධාරි
*සේවා ගණය* - ''කණිෂ්ඨ කළමනාකාර''
*පුරප්පාඩු ගණන* - 03

07.1 සුදුසුකම් :

07.1.1. බාහිර අයදුම්කරුවන්—

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/අපරාධ විද්‍යාව/සමාජ වැඩ/සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සහ

ඉහත සඳහන් ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (ඉහත තනතුරු 01, 02, 03, 04, 05, 06, සහ 07 හි දැක්වෙන තනතුරු සඳහා)

(පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

හෝ

2. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 5ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම;

හෝ

3. කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම;

හෝ

4. බලාත්මක කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ/ව්‍යාප්ති නිලධාරි සේවා ගණයේ තනතුරක වසර 08ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

*වැටුප් කාණ්ඩය* - JM 1-1

*වැටුප් පරිමාණය* - රු. (42,600 x 10 x 755 - 18 x 1,135 -රු. 70,580)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ)

*වයස* : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

08. *තනතුරු නාමය* - සහකාර උපදේශන නිලධාරි.
*සේවා ගණය* - ''බලාත්මක කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ/ව්‍යාප්ති නිලධාරි''
*පුරප්පාඩු ගණන* - 05

08.1 සුදුසුකම් :

08.1.1 බාහිර අයදුම්කරුවන්—

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/මනෝ විද්‍යාව/අපරාධ විද්‍යාව/සමාජ වැඩ පිළිබඳ යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සහ

තනතුරට අදළ ක්ෂේත්‍රයේ වසර 01කට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

09. *තනතුරු නාමය* - සහකාර පර්යේෂණ නිළධාරි
*සේවා ගණය* - ''බලාත්මක කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිලධාරි''
*පුරප්පාඩු ගණන* - 02

09.1 සුදුසුකම්;

09.1.1 බාහිර අයදුම්කරුවන්—

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/අපරාධ විද්‍යාව/සමාජ වැඩ/සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සහ

තනතුරට අදළ ක්ෂේත්‍රයේ වසර 01කට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

10. *තනතුරු නාමය* - සහකාර බාහිර සේවා නිළධාරි
සේවා ගණය - ''බලාත්මක කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ/ව්‍යාප්ති නිලධාරි''
*පුරප්පාඩු ගණන* - 06

10.1 සුදුසුකම්;

10.1.1. බාහිර අයදුම්කරුවන්—

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජ වැඩ පිළිබඳ යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සහ

තනතුරට අදළ ක්ෂේත්‍රයේ වසර 01කට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

11. *තනතුරු නාමය* - සහකාර නිළධාරි
*සේවා ගණය* - ''බලාත්මක කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ/ව්‍යාප්ති නිලධාරි''
*පුරප්පාඩු ගණන* - 04

11.1 සුදුසුකම්;

11.1.1. බාහිර අයදුම්කරුවන්—

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම;

සහ

තනතුරට අදාල ක්ෂේත්‍රයේ වසර 01කට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

12. *තනතුරු නාමය* - සහකාර මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු නිලධාරි
*සේවා ගණය* - ''බලාත්මක කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ/ව්‍යාප්ති නිලධාරි''
*පුරප්පාඩු ගණන* - 03

12.1 සුදුසුකම්;

12.1.1. බාහිර අයදුම්කරුවන්—

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සමාජීය විද්‍යාවන් යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

සහ

තනතුරට අදල ක්ෂේත්‍රයේ වසර 01කට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (ඉහත 08, 09, 10, 11 හා 12 හි දක්වෙන තනතුරු සඳහා)

(පහත සුදුසුකම් 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

හෝ

2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කළමනාකාර සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි II වන ශ්‍රේණියේ අදළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදයක සේවා කාලයක් සපුරා තිබීම.

*වැටුප් කාණ්ඩය* - MA 5-2

*වැටුප් පරිමාණය* - රු. (36,850 - 10 x 755 - 15 x 930 - 5 x 1,135 - රු. 64,025)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

*වයස* : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදල නොවේ.

13. *තනතුරු නාමය* - උපදේශන සහකාර
*සේවා ගණය* - ''කළමනාකරණ සහකාර'' තාක්ෂණ
*පුරප්පාඩු ගණන* - 30

13.1 සුදුසුකම් :

13.1.1. බාහිර අයදුම්කරුවන්—
තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක අදළ ක්ෂේත්‍රයකින් ඩිප්ලෝමාවක් ලබා තිබීම;

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම;

සමග

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් උපදේශනය/සමාජ විද්‍යාව/අපරාධ විද්‍යාව/මනෝ විද්‍යාව/සමාජ වැඩ යන විෂය ක්ෂේත්‍රයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

14. *තනතුරු නාමය* - බාහිර සේවා සහකාර
*සේවා ගණය* - ''කළමනාකරණ සහකාර'' - තාක්ෂණ
*පුරප්පාඩු ගණන* - 04

14.1 සුදුසුකම් :

14.1.1. බාහිර අයදුම්කරුවන්—
තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක අදළ ක්ෂේත්‍රයකින් ඩිප්ලෝමාවක් ලබා තිබීම;

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම;

සමග

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් උපදේශනය/සමාජ විද්‍යාව/අපරාධ විද්‍යාව/මනෝ විද්‍යාව/සමාජ වැඩ යන විෂය ක්ෂේත්‍රයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

15. *තනතුරු නාමය* - මත්ද්‍රව්‍ය අධ්‍යාපන හා තොරතුරු සහකාර
*සේවා ගණය* - ''කළමනාකරණ සහකාර'' - තාක්ෂණ
*පුරප්පාඩු ගණන* - 03

15.1. සුදුසුකම් :

15.1.1. බාහිර අයදුම්කරුවන්—

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක අදාළ ක්ෂේත්‍රයකින් ඩිප්ලෝමාවක් ලබා තිබීම;

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම;

සමග

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් සමාජ විද්‍යාව/අපරාධ විද්‍යාව/මනෝ විද්‍යාව/සමාජ වැඩ/සන්නිවේදනය යන විෂය ක්ෂේත්‍රයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

16. *තනතුරු නාමය* - පර්යේෂණ සහකාර
*සේවා ගණය* - ''කළමනාකරණ සහකාර'' - තාක්ෂණ
*පුරප්පාඩු ගණන* - 06

16.1 සුදුසුකම් :

16.1.1. බාහිර අයදුම්කරුවන්—

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් ලබා තිබීම;

හෝ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සමග

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් උපදේශනය/සමාජ විද්‍යාව/අපරාධ විද්‍යාව/මනෝ විද්‍යාව/සමාජ වැඩ යන විෂය ක්ෂේත්‍රයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

17. *තනතුරු නාමය* - හෙද නිලධාරි
*සේවා ගණය* - ''කළමනාකරණ සහකාර'' - තාක්ෂණ
*පුරප්පාඩු ගණන* - 04

17.1. සුදුසුකම් :

17.1.1. බාහිර අයදුම්කරුවන්—

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක හෙද සේවය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

18. *තනතුරු නාමය* - රසායනාගාර තාක්ෂණික ශිල්පී
*සේවා ගණය* - ''කළමනාකරණ සහකාර'' - තාක්ෂණ
*පුරප්පාඩු ගණන* - 04

18.1 සුදුසුකම් :

18.1.1. බාහිර අයදුම්කරුවන් :

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක රසායනාගාර තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (ඉහත 13, 14, 15, 16, 17 සහ 18 හි දැක්වෙන තනතුරු සඳහා)

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදළ වේ.

වැටුප් කාණ්ඩය - MA2-1

*වැටුප් පරිමාණය* - රු. (30,310 - 10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 - 50,940)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

වයස : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදල නොවේ.

19. තනතුරු නාමය - කළමනාකරණ සහකාර
සේවා ගණය - ''කළමනාකරණ සහකාර'' - තාක්ෂණික නොවන
පුරප්පාඩු ගණන - 03

19.1 සුදුසුකම් :

19.1.1. බාහිර අයදුම්කරුවන්—

අධ්‍යාපන :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

i. සිංහල/දෙමළ
ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04)කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් තිබීම.

(පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන්)

19.1.2. අභ්‍යන්තර අයදුම්කරුවන් :

(අ) අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත, 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,
 i. සිංහල/දෙමළ
 ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06)කින් සමත්ව තිබීම.

(පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන්)

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**සටහන් :-** (I)

යම් තනතුරකට ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තාවූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත ''ඉ'' ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා කාලපරිච්ඡේද ඉහත ''ආ'' ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාලසීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

වැටුප් කාණ්ඩය - MA 1-1

*වැටුප් පරිමාණය* - රු. (27,910 - 10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 -රු. 48,540/-)

(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.)

*වයස* : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදල නොවේ.

*වෙනත්* :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

*අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය* :

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් යොමු කළ යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමවේදය* :

බඳවා ගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරග විභාගයක හා/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

*පත්වීමේ ස්වභාවය* :

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

*අයදුම්පත් ගාස්තුව* :

බාහිර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තුව වශයෙන් රු. 500 ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ''අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය'' නමින් ලංකා බැංකුවේ අංක 1643 යටතේ පවත්වාගෙන යන ගිණුමට බැර කර, මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතක් ඔබ ළඟ තබාගෙන එහි මුල් පිටපත (deposit slip) අයදුම්පතට අමුණා එවිය යුතුය. අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

ඔබගේ තොරතුරු ''A4'' ප්‍රමාණයේ පිටුවෙහි දෙපසම ප්‍රයෝජනයට ගනිමින් මණ්ඩලයේ වෙබ් පිටුවේ : (www.nddcb.gov.lk) ඇති ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර (කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදල සහතිකවල පිටපත් සමග 2021.03.19 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින් තම අයදුම්පත් ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.

අසම්පූර්ණ අයදුම්පත්/, මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත අමුණා නොමැති අයදුම්පත්/ආදර්ශ අයදුම්පත නොමැති අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසන් තීරණය වේ.

සභාපති,
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

383, කෝට්ටේ පාර,
රාජගිරිය.

02-746

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය**
**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය**
**ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක**

ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම - 2020/2021 කණ්ඩායම

කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත මෙම පාඨමාලාව ඉදිරියේදී උපාධි පාඨමාලාවක් දක්වා පරිවර්තනය කිරීමට සැලසුම් සකස් කරමින් පවතී. මෙම විභාගය ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය විසින් කරනු ලබන නියමයන්ට යටත්ව විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 ජුනි මස අවසානයේ පවත්වනු ලැබේ.

විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදු වේ.

1. යෝග්‍යතාව :

1.1 *අධ්‍යාපන සුදුසුකම් :*
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් තුන (03) එකවර සමත් වීම;

සහ

සියලුම පාඨමාලා සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී තෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

1.2 *වයස :*
2021.09.30 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 25 ට නොවැඩි විය යුතුය.

- ❖ ඒ අනුව 2003.09.30 දිනට හෝ ඊට පෙර හා 1996.09.30 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

- ❖ *සැලකිය යුතුයි.-* නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා තෝරා ගැනීමේ දී වයස අවුරුදු 20 ට අඩු අයදුම්කරුවන් හට ප්‍රමුඛත්වය දෙනු ලබයි.

2. *තෝරාගැනීමේ පදනම් ක්‍රියාපටිපාටිය :*

2.1 ඉහත අංක 1.1 ඡේදයෙහි සඳහන් ඇතුළත් කරගැනීම සඳහා වූ අවම සුදුසුකම් සහිත අංක 1.2 ඡේදයෙහි සඳහන් වයස සීමාව තුළ වූ අයදුම්කරුවන්ගෙන් පහත දැක්වෙන ක්‍රමයට තෝරාගැනීම සිදුකරනු ලැබේ.

**ලිඛිත පරීක්ෂණය :**

2.2 මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වූ ලිඛිත විභාගයකට පෙනී සිටිය යුතුය.

මෙම විභාගය පහත සඳහන් පරිදි බහුවරණ ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

(01) සාමාන්‍ය බුද්ධිය - කාලය පැය 01 - ලකුණු 100
(02) තාක්ෂණික හා පොදු පරීක්ෂණය - කාලය පැය 01 - ලකුණු 100

මෙම තාක්ෂණික හා පොදු පරීක්ෂණය යටතේ ඔබගේ දැනුම සිවිල් ඉංජිනේරු, විදුලි ඉංජිනේරු, යාන්ත්‍රික ඉංජිනේරු, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සංයුක්ත ගණිතය හා තොරතුරු තාක්ෂණය යන මාතෘකා යටතේ පරීක්ෂා කෙරේ.

2.3 මෙම ලිඛිත පරීක්ෂණය පහත සඳහන් නගරවලදී පවත්වන අතර අයදුම්කරුවන් විසින් තම අයදුම්පතේ ආසන්න විභාග මධ්‍යස්ථාන 02 ක් සඳහන් කළ යුතුය. (මෙහිදී අවසන් තීරණය විභාග දෙපාර්තමේන්තුව සතු වේ.)

| | | | |
|---|---|---|---|
| 01. | කොළඹ | 06. | කුරුණෑගල |
| 02. | ගාල්ල | 07. | යාපනය |
| 03. | රත්නපුර | 08. | මඩකලපුව |
| 04. | මහනුවර | 09. | අනුරාධපුර |
| 05. | බදුල්ල | | |

- (ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන සියලුම අයදුම්කරුවන් වෙත සති දෙකකට පමණ පෙර ඒ බව විභාග දෙපාර්තමේන්තුව මගින් දැනුම් දෙනු ලැබේ.)

2.4 *සම්මුඛ පරීක්ෂණය :*
ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයේ ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අනුපිළිවෙලට අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

2.5 *තෝරාගැනීමේ පදනම* :

| | |
|---|---|
| ලිඛිත පරීක්ෂණය සඳහා නිර්දේශිත ලකුණු ප්‍රමාණය | 60% |
| Z -score අගය සඳහා නිර්දේශිත ලකුණු ප්‍රමාණය | 20% |
| සම්මුඛ පරීක්ෂණය සඳහා නිර්දේශිත ලකුණු ප්‍රමාණය | 20% |

සම්මුඛ පරීක්ෂණය සඳහා නිර්දේශිත ලකුණු ප්‍රමාණය පහත පරිදි ලබා දෙනු ලැබේ. :-

| | |
|---|---|
| විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ලකුණු ප්‍රමාණය | 10% |
| සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීමේ පෙර සූදනම හා එයට පෙනී සිටීමේ පිළිවෙළ සඳහා ලකුණු ප්‍රමාණය | 10% |

ඉහත සඳහන් පරීක්ෂණ සඳහා මුළු ලකුණු ප්‍රමාණය පදනම් කරගෙන වැඩිම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අනුපිළිවෙලට පාඨමාලාව සඳහා ආධුනිකයින් 500 ක් තෝරාගනු ඇත.

2.6 තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් ඔවුන් එම කෂේත්‍රයේ ලියාපදිංචි වීමට පෙර ඔවුන්ගේ වියදමින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය. (නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් එම ක්ෂේත්‍රයේ ලියාපදිංචි වීමෙන් පසු ඔවුන්ගේ වියදමින් නැවතත් විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.)

2.7. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

2.8 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ පාඨමාලාව සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

3. *අයදුම් කිරීමේ පිළිවෙල* :

3.1 සෑම අයදුම්කරුවෙකු විසින්ම තම අයදුම්පත ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් පරිදි විභාග සහ පරිපාලන කටයුතු සඳහා ගාස්තු ලෙස රු. 3000 ගෙවිය යුතුය. (මෙම ගාස්තුව කුමන හේතුවක් මත හෝ නැවත නොගෙවනු ලබයි.)

3.2 මුදල් තැන්පතු කුවිතාන්සිය පහත සඳහන් කරුණු සහිතව නිසි පරිදි සම්පූර්ණ කළ යුතුය.

(i) ශාඛා අංකය සහ ගිණුම් අංකය - 276-1-001-8-6351396.
(ii) බැර උපදෙස් - මහජන බැංකුව, කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ශිෂ්‍ය සුභසාධන ගිණුම් අංක 276-1-001-8-6351396 ට බැර පිණිස
(iii) අයදුම්කරුගේ නම සහ ලිපිනය

**සැලකිය යුතුයි.*-මෙම ගෙවීම දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකට කළ හැකිය.

3.3 **අයදුම්පත් සහ ආයතනය පිළිබඳ වැඩි විස්තර ''www.iet.edu.lk'' යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.**

3.4 මුදල් ගෙවීම් කරන ලද බැංකු ශාඛාවේ බලයලත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද තැන්පතු කුවිතාන්සිය, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග පරිලෝකනය (Scan) කර 2021 මාර්තු මස 25 වන දින හෝ ඊට ප්‍රථම ''apply2021@ietonline.edu.lk'' යන ඊ මේල් ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.5 *රජයේ උසස් අධ්‍යාපන ආයතනයක ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාවට සමාන මට්ටමේ පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරමින් සිටින අයට හෝ රජයේ විශ්වවිද්‍යාලයක පූර්ණ කාලීන උපාධි පාඨමාලාවක් හදාරමින් සිටින අයට මේ සඳහා අයදුම් කළ නොහැක.*

3.6 අයදුම්පත් ලැබුණු බවට අයදුම්කරුවන්ට දැනුම් දෙනු නොලැබේ.

4. *ආයතනය මගින් පවත්වනු ලබන පාඨමාලා* :

4.1 සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය :

1. සිවිල් - ගොඩනැගිලි සහ ව්‍යුහ ඉංජිනේරු පාඨමාලාව
2. සිවිල් - මහාමාර්ග සහ දුම්රිය මාර්ග ඉංජිනේරු පාඨමාලාව
3. සිවිල් - ජල සහ පාරිසරික ඉංජිනේරු පාඨමාලාව

4.2 විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ක්ෂේත්‍රය
4. විදුලි හා විද්‍යුත් - ජාල හා සන්නිවේදන ඉංජිනේරු පාඨමාලාව
5. විදුලි හා විද්‍යුත් - විදුලි බල ඉංජිනේරු පාඨමාලාව

4.3 යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය
6. යාන්ත්‍රික - ස්වයංචලන ඉංජිනේරු පාඨමාලාව
7. යාන්ත්‍රික - යාන්ත්‍රික (නිෂ්පාදන) ඉංජිනේරු පාඨමාලාව
8. යාන්ත්‍රික - නාවික ඉංජිනේරු පාඨමාලාව
9. යාන්ත්‍රික - ගොඩනැගිලි සේවා ඉංජිනේරු පාඨමාලාව

❖ ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ නාවික ඉංජිනේරු පාඨමාලාව - ISO 9001:2015 තත්ත්ව සහතිකය යටතේ පැවැත්වේ.

❖ නාවික ඉංජිනේරු පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ අන්තර්ජාතික සමුද්‍ර සංවිධානයේ STCW - 95 සහ 7.04 ආදර්ශ පාඨමාලාව හා සම්බන්ධිත නාවික ඉංජිනේරු කාරක මට්ටමේ දැනුම, අවබෝධය සහ ප්‍රවීණතාව පිළිබඳ විධානානුකූල අවශ්‍යතා සපුරාලනු පිණිස වේ.

5. *පුහුණු කිරීමේ කාලය පිළිබඳ විස්තර* :
මෙම පාඨමාලාවේ කාලය වසර හතරකි. මාස 24 ක න්‍යායික උපදෙස් පාඨමාලාව, මාස 24 ක ප්‍රායෝගික පුහුණුව සමග පහත දැක්වෙන ආකාරයට සකස් කර ඇත.

| | |
|---|---|
| ප්‍රථම අධ්‍යයන වර්ෂය ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ දී | - මාස 12 |
| මූලික කර්මාන්ත පුහුණුව බාහිර කර්මාන්ත ආයතන තුළදී | - මාස 12 |
| අවසාන න්‍යායික උපදෙස් වැඩසටහන ඉංජිනේරු තාක්ෂණ ආයතනයේදී | - මාස 12 |
| අවසාන කර්මාන්ත පුහුණුව බාහිර කර්මාන්ත ආයතන තුළ දී | - මාස 12 |

මෙම ඉංජිනේරු පාඨමාලාවට අයත් න්‍යායික උපදෙස් හා පාඨමාලා ප්‍රායෝගික කාර්යයන් මෙම ආයතනයේදී ලබාදෙන අතර, කර්මාන්ත පුහුණුව පිළිගත් කර්මාන්ත ආයතන මගින් ලබා දෙනු ඇත. පාඨමාලාව ආරම්භයේදී ඉංග්‍රීසි පාඨමාලාවක් පවත්වනු ලබන අතර එයට සියලුම ආධුනිකයින්ගේ සහභාගීත්වය අනිවාර්ය වේ.

6. *පාඨමාලා මාධ්‍යය* - ඉංග්‍රීසි භාෂාවෙනි.

7. *ආධුනිකත්ව ගිවිසුම* :
7.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම ආධුනිකයා සහ කාර්මික පුහුණු වන ආයතනය යන දෙදෙනා වෙත වගකීම් පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළු විය යුතුය.
7.2 පුහුණුව අවසාන වීමෙන් පසුව ආධුනිකයින් සඳහා රැකියා සැපයීමට ආයතනය බැඳී නොමැත.
7.3 **මෙම පාඨමාලා සඳහා ලියාපදිංචි වන සියලුම සිසුන් මුළු පාඨමාලා කාලය තුළදී පැමිණීමේ ප්‍රතිශතය, ආයතනය මගින් නිකුත් කර ඇති සීමාවන්ට යටත්ව තබා ගත යුතු අතර, එසේ නොවන අවස්ථාවලදී අදාළ විභාගවලට පෙනී සිටිය නොහැකි අතර පාඨමාලාවෙන් ඉවත් විය යුතු වේ.**

8. ආධුනිකයින් ලියාපදිංචිය :

8.1 පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේදී නැවත ආපසු ගෙවනු ලබන රු. 5000.00 ක තැන්පතු මුදලක් ලබා දිය යුතුය. මෙම තැන්පත් මුදල ආපසු ලබා ගත හැක්කේ පාඨමාලාව සාර්ථකව අවසන් කළ අයෙකුට පමණි.

තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකුම පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේදී, ලියාපදිංචි ගාස්තු වශයෙන් රු. 500 ක් ද සිසුන්ගේ අධ්‍යයන ලේඛන කටයුතු සහ පුස්තකාල අරමුදල සඳහා රු. 2000.00 ක් ද වශයෙන් රු. 2500.00 ක නැවත නොගෙවන මුදලක් ආයතනය වෙත ගෙවිය යුතුය. තවද අ.පො.ස.(සා. පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල සනාථ කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් අය කරන මුදල ගෙවිය යුතුය.

8.2 සමෘද්ධි සහනාධාර හිමි පවුලක සාමාජිකයෙකු නම් ඊට අදාළ මුල් පිටපත් (සමෘද්ධි කාඩ්පත හා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ලිපිය) ඉදිරිපත් කිරීමෙන් නැවත ගෙවන පදනමින් යුත් තැන්පත් මුදලින් නිදහස් විය හැක.

09. *සහතික ප්‍රදානය* - සාර්ථක ලෙස න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව අවසන් කර සමත්වන ආධුනිකයින් හට ආයතනයට ඇති සියලුම බැඳීම්වලින් නිදහස් වූ පසු, ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ඇත.

10. ප්‍රමාද වී එවන අයදුම්පත් සම්බන්ධයෙන් ඉංජිනේරු තාක්ෂණ ආයතනය වග කියනු නොලැබේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

For office use
(Application No.)

For office use
(Index No.)

**NATIONAL APPRENTICE AND INDUSTRIAL TRAINING AUTHORITY INSTITUTE OF ENGINEERING TECHNOLOGY - KATUNAYAKE**

APPLICATION FOR THE RECRUITMENT OF SPECIAL APPRENTICES IN ENGINEERING FOR NATIONAL DIPLOMA IN ENGINEERING SCIENCES (NDES) COURSE- 2020/2021 BATCH

❖ Select two centers nearest to you from the exam centres below. :-

01 Colombo
02 Galle
03 Ratnapura
04 Kandy
05 Badulla
06 Kurunegala
07 Jaffna
08 Batticaloa
09 Anuradhapura.

| Preference | No. of the exam centre |
|---|---|
| 1 | |
| 2 | |

1. Name in Full :
(Fill in block letters)

(Eg. ARACHCHILAGE SASEN CHAMARA FERNANDO)

2. Name with Initials :
(Eg. A. S. C. FERNANDO)

3. Address :
(Fill in block letters)

4. Telephone No. : Mobile : Residence :

5. E- mail Address :

6. District :

7. Divisional Secretariat :

8. Grama Niladhari Division : Division Number

9. Date of Birth :

(i) Date Month Year

(ii) Age as at 30.09.2021: Months Years

10. Sex : Male - 0
Female - 1 [ ] (Write the relevant number inside the cage.)

11. NIC No. : [ ]

12. Nationality : [ ]

13. Educational Qualification : Index No. [ ] Year [ ]

(i) G. C. E. (O/L)

| S. No. | Subject | Grade |
|---|---|---|
| 1 | Religion | |
| 2 | First Language | |
| 3 | Second Language (English) | |
| 4 | Science | |
| 5 | Mathematics | |
| 6. | History | |
| 7 | | |
| 8 | | |
| 9 | | |

Performance in English Language at G. C. E. (O/L) Examination : [A] or [B] of [C]
(Tick the relevant box.)

| Attempt | Year | Index No. |
|---|---|---|
| | | |

(ii) Result of G. C. E. (A/L) Examination (Subjects Passed in one sitting)

| | | | | | |
|---|---|---|---|---|---|
| Year | | | | | |
| Index No. | | | | | |
| Z-Score Marks | | | | | |
| Medium | | | | | |
| Subject | Combined Mathematics | Physics | Chemistry | English | Common General Test Marks |
| Grade | | | | | |

(iii) Number of sittings for G. C. E. (A/L) Examination : [ ]

14. Order of preference of fields of specialization :
(Mark from 1 to 9 based on order of preference)

| Serial No. | Field | Code | Preferences |
|---|---|---|---|
| 1 | Civil - Building and Structural Engineering | CB | |
| 2 | Civil - Highway and Railway Engineering | CH | |
| 3 | Civil - Water and Environmental Engineering | CW | |
| 4 | Electrical - Network and Communication Engineering | EN | |

| Serial No. | Field | Code | Preferences |
|---|---|---|---|
| 5 | Electrical - Electrical Power Engineering | EP | |
| 6 | Mechanical - Automotive Engineering | MA | |
| 7 | Mechanical - Production Engineering | MP | |
| 8 | Mechanical - Marine Engineering | MM | |
| 9 | Mechanical - Building Services Engineering | MB | |

I do hereby certify that the information furnished above is true and correct and confirm to the qualifications laid in the advertisement and I have not registered for full time Degree or Diploma in a University or any other Government Academic Institutions. I hereby state that I am prepared to accept discontinuance from the training programme without any claim for compensation, if any of the above information is found to be false or inaccurate even after the commencement of the training programme. Further, I do agree to abide by the rules and regulations imposed by the Commissioner General of Examination s of Conducting the Examination and on releasing results.

———,
Signature of Applicant.

Date :———.

*(Please affix the scanned copy of payment receipt for Rs.3000.00)*

---

For office use only

| | |
|---|---|
| Age Limit | Within/Exceeded |
| Basic Qualification | Adequate/Inadequate |
| Applications | Complete/Incomplete |
| Accepted/Rejected<br>……………<br>Checked by | <br>……………<br>Approved by |

**NATIONAL APPRENTICE AND INDUSTRIAL TRAINING AUTHORITY**
**INSTITUTE OF ENGINEERING TECHNOLOGY - KATUNAYAKE**

*Recruitment of Special Apprentices in Engineering for National Diploma in Engineering Sciences (NDES) Course - 2020/2021 Batch*

**Instructions for Completing the Application Form**

01. The application should be in accordance with the *Gazette notification* and www.iet.edu.lk web site. All other applications will be rejected.

02. Applications of the applicants, who do not possess the required qualifications, as mentioned in the *Gazette notification* will be rejected.

03. (a) The applicant should have to pay Rs. 3000.00 to any branch of People's Bank and scanned copy of pay - in - slip should be affixed in the space provided in the application.
(b) The Pay - in - Slip should contain the following compulsory information.
(i) **Branch Code and Account No.** 276-1-001-8-6351396

(ii) **Credit Instruction** - To the credit of Institute of Engineering Technology Student welfare Account No. 276-1-001-8-6351396 at People's Bank, Katunayake.

(iii) **Name and the address of the applicant.**

(04) Duly filled application form, should be sent to "*apply 2021@ietonline.edu.lk*" using your permanent e-mail address **before 25th March 2021**. Late applications will be rejected.

❖ Note : All the future comminication will be done with you, through your permanent e-mail address.

(05) Subject for the email should be your NIC number.

Ex. Student name A. B. C. Perera.
NIC 19971782003
NIC 971782003

Your email subject should be as- NIC 19971782003
NIC 971782003

*N. B.* : All information asked in the application form should be completed and no blank space should be left.

Incomplete applications will be rejected without notice.

02-726

---

**මුදල් අමාත්‍යාංශය**
**රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව**

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර/කාර්යාලගත නිලධාරී බණ්ඩ -2 හි II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2021

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරට 153 දෙනකු බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 ජූනි මාසයේදී කොළඹදී පමණක් පවත්වනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය යථා කාලයේදී පුවත්පත් මගින් දැනුම් දෙනු ඇත. මෙකී විභාගය කල්දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය ප්‍රධාන තක්සේරුකරු සතුවේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම මෙම තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *සුදුසුකම්* :

I *අධ්‍යාපන සුදුසුකම්* :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේපළ කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවරුන්ගේ රාජකීය ආයතනයේ සාමාජිකත්වය සහිත වරලත් තක්සේරුකරුවකු වීම.

II *කායික සුදුසුකම්* :

සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

III *වෙනත් සුදුසුකම්* :
(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ආ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාග යට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් 2021 මාර්තු 25 දිනට සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

02. *වයස* :
I අවම සීමාව :- අවු. 21 ට නොඅඩු
II උපරිම සීමාව :- අවු.35ට නොවැඩි
(ඒ අනුව 2000.03.25 දිනට හෝ ඊට පෙර හා 1986.03.25 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

*සටහන* :
I යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට ඉඩ ලබා නොදෙනු ඇත.

03. *සේවා කොන්දේසි* :

I වැටුප- මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් පරිමාණය පහත දැක්වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි අනුව වැටුප් පරිමාණය MN 5 දරන වැටුප් ඛණ්ඩයේ රු. 34 605-10X 660-11 X 755-15 X 930 - 63 460/- ක් වේ.

II මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතුය.

III තෝරාගත් අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් පත්වීමේ දින සිට තුන් අවුරුදු (03) පරිවාස කාලයට යටත්ව පත් කරනු ලැබේ.

IV පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසුද නැතිද යන වගට ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුවේ.

V පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිනු ඇත.

VI රාජ්‍ය සේවා කොමිෂන් සභා අංක: 1589/30 හි සඳහන් කාර්ය පටිපාටික රීතිවල සඳහන් කොන්දේසිවලට හා මෙම *ගැසට්* පත්‍රයේ 1 වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම්වලට අදාළ පොදු කොන්දේසි වලටද අවධානය යොමු කෙරේ.

VII මෙම තනතුර අංක: 2142/75 හා 2019.09.27 දිනැති *ගැසට්* නිවේදනයේ පළකර ඇති ශ්‍රී ලංකා තක්සේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පවතින විධිවිධානවලට අනුව පාලනය වනු ඇත.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලබන අතරම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා නොදේ. එහිදී, අදාළ සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලැබේ.

05. *විභාග පරිපාටිය* :

බඳවා ගැනීම සඳහා වන තරග විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහතින් දැක්වේ :

| විෂයය අංක | ප්‍රශ්න පත්‍රයේ නම | කාලය පැය/විනාඩි | සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය I කොටස | විනාඩි 30 | 40 | 100 |
| 02 | විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය II කොටස | පැය 1 1/2 | 40 | 100 |

(අ) විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය I කොටස
දේපළ පාලනය සහ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සඳහා හදාරනු ලබන විෂයන්ට අදාළ ප්‍රශ්න 25කට නොවැඩි බහුවරණ ප්‍රශ්න ඇතුළත් වේ.

(ආ) විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය II කොටස
දේපළ පාලනය සහ තක්සේරු ශාස්ත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සඳහා හදාරනු ලබන විෂයය ක්ෂේත්‍රයට අදාළ මාතෘකාවන් ඇතුළත්ව සකස් කෙරුණු රචනා සහ ව්‍යුහගත ශෛලියේ ප්‍රශ්න ඇතුළත් වේ.

**සටහන :**

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගය සඳහා අයදුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(I) නොපැහැදිලි අත් අකුරු හා වැරදි අක්ෂර වින්‍යාසයටද ලකුණු අඩු කරනු ලැබේ.

(II) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කර ඇති අපේක්ෂකයින්ට/අපේක්ෂිකාවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම විභාගය සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැලිකිය යුතුය.

(III) *ඇගයීමේ ක්‍රමය* : තරග විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් තෝරා ලකුණුවල එකතුවට අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ඔවුන් අතරින් ඉහළම ලකුණු

ලබාගත් අපේක්ෂකයාගේ සිට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුපාතිකව අපේක්ෂකයින් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

06. *තෝරා ගැනීමේ පදනම* :
ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් අදාළ බඳවාගැනීම සඳහා පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරා ගනු ලැබේ.

(1) *ප්‍රතිඵල නිකුත් කිරීම* :
ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගේ ලිඛිත විභාග ලකුණු අනුව සකස්කළ ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රධාන තක්සේරුකරු වෙත දැනුම් දෙනු ලබන අතර, විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් සඳහා ද අදාළ ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කිරීමෙන් හෝ තැපැල් මගින් හෝ දැනුම් දෙනු ඇත.

07. සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

08. *ඉල්ලුම් කිරීමේ පිළිවෙල* :

*ආදර්ශ අයදුම්පත* :

(I) මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇත. අයදුම්කරුවන් විසින් මෙකී ආදර්ශ අයදුම්පත තමා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන්ම පිළියෙළ කළ යුතු අතර, එය තමන්ගේම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදිම අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා "අදාළ නොවේ"යනුවෙන් සටහන් කළ යුතුය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේම සිහි තබා ගත යුතුය. (ආදර්ශ අයදුම්පතේ 01 සිට 05 තෙක් ශීර්ෂ 1 වන පිටුවටද, 06 සිට 11 තෙක් ශීර්ෂ දෙවන පිටුවේද ඉතිරිය තුන්වන පිටුවට ද වනසේ A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කරන්න). අයදුම්පත පිළියෙළ කිරීමේදී විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය* :

(II) අයදුම්පත් 2021 මාර්තු 25 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, පැලවත්ත, බත්තරමුල්ල" ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය" ලෙස විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය.

*විභාග ගාස්තු* :

(III) විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 20-03-02-13 යටතේ ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට පමණක් විභාග ගාස්තු වශයෙන් රුපියල් 750/-ක මුදල් ගෙවා ලබාගත් ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකරනු ඇත. මුදල් ගෙවූ ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබා ගැනීම ඉතාම යෝග්‍ය වේ.

*දැනටමත් සේවයේ යෙදී සිටින්නන්ගේ අයදුම්පත්* :

(IV) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.2021 මාර්තු 25 දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමක් ද සමග ස්වකීය අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රධාන තක්සේරුකරුගේ නමට හෝ එම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුගේ පෞද්ගලික නමට අයදුම්පත් නොඑවිය යුතුය.

දෙපාර්තමේන්තු මගින් ඉදිරිපත් කරන අයදුම්පත් වුවද නියමිත දිනට පසුව ලැබුණහොත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අයදුම්පත්වල අත්සන සහතික කිරීමේදී අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව තබා නොමැති නම් එම අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

*අයදුම්පත් සහතික කිරීම* :

(V) දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවකුගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි.

09. *විභාග ප්‍රවේශ පත්‍ර* :

(I) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත

විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත් සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරු අත්සන හා අත්සන සහතික කිරීමද, අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත්කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත් පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අයදුම්කරුවකු වේනම් දැන්වීමේ සඳහන් ආකාරයට විභාග දෙපාර්තමේන්තුව වෙත ඒ පිළිබඳව දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ඉහත විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායි වේ. එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපත විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම වඩාත් ඵලදායි වනු ඇත.

*විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍ර සහතික කර ගැනීම :*

(II) දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන් ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, නාවික, ගුවන් හෝ යුධ හමුදාවක කොමිෂන් ලත් නිලධාරියකු, රජයේ ස්ථිර සේවයේ මාණ්ඩලික නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන කෙනෙකු විය යුතුය.

*විභාගයට ඇතුළත්කර ගැනීම :*

(III) විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තමාගේ අත්සන සහතික කරවා ගත යුතු අතර, නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින පළමු දිනයේම, විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරන අපේක්ෂකයකුට විභාගයට ඇතුළත් වීමට ඉඩ නොලැබෙනු ඇත.

(IV) අයදුම්පත් ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු නොලබන අතර, විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහු හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන* :- විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අපේක්ෂකයකු විභාගයට පෙනී සිටීමට හෝ තනතුර සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකේ.

10. *අනන්‍යතාව* :-අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රයක්)
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම*.- මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවක දී වුවද, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අපේක්ෂකයකු විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවත් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාග යට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවකදී ඔප්පු වුවහොත්, හෝ ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13 මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය ප්‍රධාන තක්සේරුකරුගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

14. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැඟුනහොත් එවැනි විටෙකදී සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.

පී. ඩී. ඩී. එස්. මුතුකුමාරණ,
රජයේ ප්‍රධාන තක්සේරුකරු.

ආදර්ශ අයදුම්පත

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර/කාර්යාලගත නිලධාරී බණ්ඩ -2 හි
II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම සඳහා වන
විවෘත තරග විභාගය - 2021

සැ. යු:- අයදුම්පත බහා එවන කවරයේ වම් කෙළවරේ ඉහළින් ශ්‍රී ලංකා තක්සේරු සේවයේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධර බණ්ඩ 02 හි II පන්තියේ II ශ්‍රේණියේ "සහකාර තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2021"යනුවෙන් සඳහන් කළ යුතු අතර, අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් විභාග කොමසාරිස් ජනරාල් ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ.1503, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතු ය.

☐

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐

(1) . අයදුම්කරුගේ නම:
- 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————————————————.
  ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (උදා : SILVA, A.B.)
- 1.2 සම්පූර්ණ නම :————————————————.
  (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
- 1.3 සම්පූර්ණ නම :————————————————.
  (සිංහලෙන් / දෙමළෙන්)

(2) පෞද්ගලික ලිපිනය :

සිංහලෙන් / දෙමළෙන් :————————————————.
(ලිපිනය වෙනස් වුවහොත් ඒ බැව් වහාම දැන්විය යුතු ය.)

ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————————————————.

(3) ස්ත්‍රී / පුරුෂ භාවය : (පුරුෂ - 0, ස්ත්‍රී - 1) ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(4) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

(5) ජංගම දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

.

(6) විවාහක / අවිවාහක : (අවිවාහක - 1, විවාහක - 2) ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(7) ජන වර්ගය ; (සිංහල - 1, දෙමළ - 2, ඉ.දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5) ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(8) උපන් දිනය : වර්ෂය : ☐ මාසය : ☐ දිනය : ☐

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

(9) ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ පෙළපතින් ද? ලියාපදිංචි කිරීමෙන් ද? යන්න සඳහන් කරන්න. :————.
(ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න) :————————————————.

(10) අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් :

| විභාගය / උපාධිය | ක්‍රියාත්මක වන දිනය | විශ්වවිද්‍යාලය / ආයතනය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(11) වර්තමාන රැකියාව සහ ඉහත දී යම් තනතුරක් දැරුවේ නම් ඒ පිළිබඳව විස්තර :

| තනතුර | සිට | දක්වා | වාර්ෂික වැටුප |
|---|---|---|---|
| | | | |

(12) ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහකර තිබේ ද ? :————————————.
(එසේ නම් විස්තර දක්වන්න)

(13) ඔබට විරුද්ධව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත වේ නම්) දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේ ද ?

(14) ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද?

(15) විභාග ගාස්තුව (ලදුපතෙහි මුල් පිටපත අමුණා තිබිය යුතු ය)

i. මුදල් ගෙවන ලද තැපැල් / උප තැපැල් කාර්යාලය :————.
ii. ගෙවූ මුදල :————.
iii. ගෙවූ දිනය :————.
iv. ලදුපත් අංකය :————.

| විභාග ගාස්තු ගෙවන ලද ලදුපතෙහි මුල් පිටපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ඡායා පිටපතක් ලග තබාගන්න) |
|---|

(16) අයදුම්කරුගේ සහතිකය :
මෙම අයදුම්පතේ මවිසින් සපයන ලද සියලු තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. එහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා සියලු අයිතිවාසිකම් රහිතව, මා සේවයෙන් පහ කරනු ලැබිය හැකි බවත් මම දනිමි.

තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (අදාළ නොවන වචන කපා හරින්න) ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................... (සම්පූර්ණ නම) මහතා / මහත්මිය / මෙනවිය යන අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය 2021 ................. මස ............... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාව තබන්න)
දිනය :————.

අයදුම්කරු රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුක්ත නම් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................... මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු /ඇය ....................... (අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / රාජ්‍ය සංස්ථාවේ ) සේවයේ නියුක්ත බවත්, ඔහුට / ඇයට එරෙහිව විනය පරීක්ෂණ කිසිවක් නොමැති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්,එම ලදුපත අලවා ඇති බවත්, ඔහු/ඇය ................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි. (තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.)

ඔහු / ඇය ශ්‍රී ලංකා තක්සේරු සේවයේ ක්ෂේත්‍ර / කාර්යාලගත නිලධර බණ්ඩ 02 හි II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු තනතුරකට පත්කිරීම සඳහා තෝරා ගතහොත් මෙම දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ සේවයෙන් මුදාහැරිය හැකි ය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

ආයතන ප්‍රධානියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
කාර්යාලයීය ලිපිනය :————.
(නිල මුද්‍රාව තබන්න)
දිනය :————.

07-732

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.